**කහවත්ත ප්‍රාදේශීය සභාව - 2022**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කහවත්ත ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ඉටු කළ රු.2,265,500ක් වූ සංවර්ධන ව්‍යාපෘති 04ක වියදම සහ රු.1,000,000ක ඉඩමක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.5,053,041ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමුච්චිත අරමුදලේ ශේෂය සහ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය අතර 2022 දෙසැම්බර් 31 දිනට රු.1,653,164ක වෙනසක් පැවැතිණි. | ඉදිරියේ දී නිවැරදිව ගැළපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 74,277,172ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් පිරිවැය තහවුරු කර ගැනීමට විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | සියලු විස්තර ඇතුළත් උප ලේඛනයක් පවත්වා ගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරන බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 හා 2017 වර්ෂවල දී ලබා දුන් රු.93,175ක් වූ අත්තිකාරම් 02ක් මුදල් රෙගුලාසි 371(5) අනුව නිරවුල්කර නොතිබුණි. | එක් අත්තිකාරමක් සඳහා විමර්ශනයක් පැවැත්වේ. රු.20,000ක අත්තිකාරම පියවන ලෙස හිටපු සභාපතිවරයා ලිඛිතව දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 14ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ප්‍රධාන කාරණා 16 වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ඇත. අනු බෙදුම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් පරීක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පරිවර්තනය සඳහා යොමු කර ඇත. | ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,223,912ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,861,704ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,431,325 | 4,264,740 | 4,125,125 | 1,547,410 | 3,862,721 | 3,917,917 | 4,094,813 | 1,423,978 |
| කුලී | 9,093,792 | 8,477,967 | 7,860,617 | 1,156,849 | 8,890,292 | 6,612,853 | 4,867,451 | 2,378,819 |
| බලපත්‍ර ගාස්තු | 1,035,000 | 1,127,066 | 1,094,466 | - | 1,079,560 | 353,950 | 842,370 | - |
| වෙනත් ආදායම් | 2,617,000 | 1,891,537 | 1,464,743 | - | 2,145,200 | 1,944,027 | 1,743,555 | - |
| | 17,177,117 | 15,761,310 | 14,544,951 | 2,704,259 | 15,977,773 | 12,828,747 | 11,548,189 | 3,802,797 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.329,167ක් වූ හිඟ වරිපනම් ශේෂය හා රු.23,858ක් වූ හිඟ අක්කර බදු ශේෂය වසර 03කට වඩා පැරණි විය. | වරිපනම් කොටසක් අයකර ඇත. ආර්ථික අර්බුදය නිසා දේපළ තහනම් නොකිරීමට සභාව තීරණය කර ඇත. තොරතුරු සොයා ගෙන හිඟ අක්කර බදු අය කෙරේ. | හිඟ ආදායම් නොපමාව රැස්කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලයට අදාළ හිඟ සතිපොළ ගාස්තු හා මාළු කඩ කුලී රු.574,320ක් ද, පොදු වෙළඳපොළ කඩකාමරයක් සඳහා මාස 23ක හිඟ කුලී රු.148,570ක් ද අයකර නොතිබුණි. | හිඟ රු.46,667ක් සභා අනුමැතියකින් කපා හැර ඇත. ඉතිරි හිඟ සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් නොපමාව රැස්කළ යුතු වේ. |
| (ඇ) | ප්‍රදර්ශිත දැන්වීම් පුවරු සඳහා සමීක්ෂණයක් 2022 වර්ෂයේ සිදු නොකළ බැවින් අයකළ එම ගාස්තුවල නිවැරදිතාව තහවුරු නොවුණි. | කොරෝනා තත්ත්වය හේතුවෙන් සමීක්ෂණ සිදු නොකළ බව. | හිඟ ආදායම් නොපමාව රැස්කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා හඳුනාගෙන තිබුණු අනවසර ඉදිකිරීම් 29ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් ලේඛනයක් නඩත්තු කිරීමට හා අනවසර ඉදිකිරීම් කළ අයට කිසිදු අවසර පත්‍රයක් නිකුත් නොකිරීමට සභා සම්මත කර ඇති බව. | අනවසර ඉදි කිරීම් හඳුනා ගෙන කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ඇන්දාන ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘතියෙහි පාරිභෝගිකයින් 30 දෙනෙකුගේ ජල මීටර් වසර 02ට වැඩි කාලයක සිට අක්‍රිය වී තිබුණ ද, ඒ සඳහා නව ජල මීටර් සවිකර නොතිබුණි. | නව සබඳතා ලබා දීමට ජල මනු යෙදවූ අතර ඉල්ලා ඇති ජල මනු 100ක් ලද පසු සවිකිරීමට කටයුතු කරන බව. | ජල මනු සවිකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | හවුපෙ වතුයායේ කසළ බැහැර කරන අක්කර 04ක භූමිය පවරා ගෙන නොතිබුණි. එමෙන්ම, වාර්ෂිකව කසළ මෙට්‍රික් ටොන් 750ක් පමණ බැහැර කිරීමට සේවකයින් 15 දෙනෙකු සහ වාහන හා යන්ත්‍ර උපකරණ 06ක් වෙනුවෙන් රු.11,290,769ක් වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැරකර නොතිබුණි. | කඩිනමින් මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කරන බව හා කසළ බැහැර කරන ඉඩම පවරා ගත් පසු කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ආරම්භ කරන බව. | ඉඩම පවරා ගැනීම කඩිනම් කළ යුතු අතර ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.2 නිෂ්කාර්යය වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අලුත්වැඩියාවක් සඳහා 2017 වර්ෂයේ දී භාර දුන් ට්‍රැක්ටරයක් වර්ෂ 05ක කාලයක් ගරාජයක් තුළ නිෂ්කාර්යව පැවතීම නිසා එන්ජිම පණ ගැන්වීමට නොහැකිව මේ දක්වාම අභාවිතව පවතී. | 2022 වර්ෂයේ දී ට්‍රැක්ටරය රැගෙන එන ලදී. රථය අලුත්වැඩියාව සඳහා ලබා දුන් අත්තිකාරම පියවීම සඳහා මු.රෙ. 104 යටතේ පරීක්ෂණයක් සිදු කරමින් පවතින බව. | කඩිනමින් පරීක්ෂණය නිමකර වගකිව යුතු අය නිශ්චය කළ යුතු වේ. |

## 3.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයිතිය සභාව සතු නොවූ වාහන 08ක අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණු අතර අබලි වාහන 05ක් අපහරණය කර නොතිබුණි. | පැවරීම් සඳහා ලිපි භාර දී මුදල් ගෙවා ඇති අතර ගැටලු විසඳමින් අපහරණය කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |